සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**


**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**

**Provincial Department of Education - NWP**

**11 ශ්‍රේණිය** | **වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024)** | **43 S I**

නම: ............................................ | **චිත්‍ර කලාව** | **කාලය පැය එකයි**

- **සියළුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01. ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පයේ කදිම නිදසුනක් වන මෙය .......................................................... ලෙස හැඳින් වේ.

02. මෙය ........................................................................................................ යුගයට අයත් විශිෂ්ට කලා කෘතියකි.

03. ඇත් දත් කැටයම්වල දැකිය හැකි සියුම් මටසිලිටු නිමාව සහිත ලක්ෂණ මෙම ................................ කැටයම්වල දැකිය හැකි වේ.

04. තිරස් අතට ඇති ගල් පතුරට කුඤ්ඤයක් ලෙස සම්බන්ධ වූ ස්ත්‍රී මූර්ති .......................................... ලෙස හඳුන්වයි.

05. උඩෙලිපත් දෙකෙලෙවර ............................................................. ලෙස හකුලා ඇති ආකාරය ආකර්ශනීය වේ.

- **ප්‍රශ්න අංක 6 සිට ප්‍රශ්න අංක 10 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

06. රෝමයේ ශාන්ත පීතර දෙව් මැදුරේ ප්‍රදර්ශනයට තබා ඇති පියෙටා මූර්තිය කාගේ නිර්මාණයක් ද?
.................................................................................................................................

07. ශිව දෙවියන් කෙරෙහි ඇති වූ අසාමාන්‍ය භක්තිය නිසා තම නාරි සෞන්දර්ය අහිමි කරවාගත් කාන්තාව නිරූපණය වන පොළොන්නරු යුගයේ හින්දු මූර්තිය කුමක් ද? ..................................................................

08. ඉස්ලාම් ආගමික ග්‍රන්ථය වන කුරානයේ ඇති පාඨ අරාබි බසින් පල්ලියේ බිත්ති මත සටහන් කර ඇත. මේවා හඳුන්වන නම කුමක්ද? ..................................................................

09. සෙල්ලම් සේන කාටූන් චරිතය නිර්මාණය කළ ශිල්පියා කවුද? ..................................................................

10. හින්දු කලා ආභාෂය හා යුරෝපයේ පැබ්ලෝ පිකාසෝගේ ඝණිකවාදී චිත්‍ර ශෛලිය ආභාෂය කරගනිමින් විහාර සිතුවම් ඇඳි ශිල්පියා කවුද? ..................................................................

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11. රෆායල්ගේ තණ පිටියේ සිටින මැඩෝනා සිතුවම කුමක් මත අඳින ලද්දක් ද?
    1. බිත්තිය මත
    2. ගුහාවක ගල් බිත්තිය මත
    3. ලී පුවරුවක් මත
    4. කැන්වසය මත

12. H.C.P. බෙල් මහතාගේ මතයට අනුව සීගිරි සිතුවම් වලින් නිරූපනය වන්නේ,
    1. විජ්ජුලතා සහ මේඝලතා
    2. පිදුරංගල විහාරය වැඳීමට යන රාජකීය කතුන්
    3. දිව්‍ය අප්සරාවන්
    4. රජ වාසල ස්ත්‍රීන්

13. ගම්පොළ යුගයේ ඉදි වූ ඇම්බැක්ක දේවාලය,
    1. දේවේන්ද්‍ර මූලාචාරීන් විසින් ඉදි කරන ලද්දකි.
    2. ගණේෂ්වරාචාරීන් විසින් ඉදි කරන ලද්දකි.
    3. ස්ථපතිරායර් විසින් ඉදි කරන ලද්දකි.
    3. දෙල්මඩ මූලාචාරීන් විසින් ඉදි කරන ලද්දකි.

14. ග්‍රීසියේ සම්භාව්‍ය යුගයට අයත් කලා ලක්ෂණයන්ගෙන් යුතු හර්මීස් සහ ඩයෝනීසස් මූර්තිය නිර්මාණය කළ ශිල්පියා වන්නේ,
    1. මයිරන් ය.
    2. ප්‍රැක්සිටෙල්ස් ය.
    3. මයිකල් ආන්ජිලෝ ය.
    4. පීඩියස් ය.

15. අජන්තා පද්මපානී බෝධිසත්ව රුව දක්නට ලැබෙන ලෙන වන්නේ
    1. අංක 1 ලෙනය.
    2. අංක 7 ලෙනය.
    3. අංක 17 ලෙනය.
    4. අංක 5 ලෙනය.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලිවන සේ වාක්‍ය බැගින් ලියන්න.**

16. අල්පනාව ..................................................................


17. පද්මාසන ක්‍රමය ..................................................................

18. ගෝපුර ..................................................................


19. යටි පුවරුව ..................................................................


20. වාත්තු වැඩ ..................................................................


- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති රූප ඉදිරියේ ඇතs A,B,C,D,E යන රූප සටහන් සමග ගලපා අදාල ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ ලියන්න.**

21.  (..............................)  A

22.  (..............................)  B

23.  (..............................)  C

24.  (..............................)  D

25.  (..............................)  E

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට අදාල හිස්තැනට සුදුසු වචනය යොදන්න.**

26. දිය සායම් භාවිතයෙන් නිමවා ඇති උළු පෝරණුව නම් චිත්‍රය .......................................... ශිල්පියාගේ විශිෂ්ට නිර්මාණයකි.

27. වෙස් මුහුණු කර්මාන්තයේදී මුහුණේ ඇස් නාසය වැනි සියුම් අංග මතු කිරීම.......................................... ලෙස හඳුන්වයි.

28. ගම්පොළ යුගයට අයත් ඇම්බැක්කේ දේවාලය .......................................................... දෙවියන් වෙනුවෙන් ඉදිකර ඇත.


29. ඉන්දු නිම්නයෙන් හමු වී ඇති අලු වැලි ගලින් කළ කවන්ද නර්ථන රුව .......................................................... දෙවියන්ගේ එක් වේශයක් නිරූපනය කරයි.

30. මහනුවර යුගයේ ශිල්පීන් බිතු සිතුවම් ඇඳීමේදී පසුබිම සඳහා වැඩි වශයෙන් .......................................................... වර්ණය භාවිත කොට ඇත.

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පහත දී ඇති F,G,H,I,J යන අක්ෂරවලින් යුත් රූප ඇසුරින් පිළිතුරු සපයන්න.**


F


G


H


I


J

31. F අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ඇඳ ඇති ශිල්ප ක්‍රමය කුමක්ද? ..............................................................................

32. G අක්ෂරයෙන් දැක්වෙන ලියන්නා හෙවත් ස්ක්‍රයිබ් මූර්තිය නිමවා ඇති මාධ්‍ය කුමක්ද? ..............................................

33. H අක්ෂරයෙන් දැක්වෙන කැටයම සඳහා කුමන කලා ලක්ෂණයක් බලපා තිබේද? ..............................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය නිර්මාණය කළ ශිල්පියා කවුද? ..............................................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය හමු වී ඇත්තේ කුමන ප්‍රදේශයකින්ද? ......................................................................

- **පහත සඳහන් කලාකෘතිය හඳුනාගෙන අංක 36 සිට 40 දක්වා දී ඇති උපමාතෘකා අනුව වාක්‍ය බැගින් ලියන්න. (තනි වචනයෙන් සපයන පිළිතුරු සඳහා ලකුණු නොලැබේ)**



36. ශිල්පියා හා තේමාව ..............................................................................................................................

37. දක්නට ඇති ස්ථානය ..............................................................................................................................

38. සංරචනය කර ඇති ආකාරය ......................................................................................................................

39. වර්ණ භාවිතය ........................................................................................................................................

40.හැඟීම් ප්‍රකාශනය ....................................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 43 S II

නම: ..........................................

## චිත්‍ර කලාව

කාලය පැය දෙකයි

### නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති රළු කඩදාසිය භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර කඩදාසිය භාවිත කරන්න.

★ **මෙම චිත්‍ර දෙකම එකට අමුනා ශාලාධිපතිට භාර දෙන්න.**

★ ඔබේ චිත්‍රය ඇගයීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා

- **වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම
3. පරිමාණ, පලුයාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

**සැලකිය යුතුයි :**

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැලපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 43 S II |

නම: ..............................................

චිත්‍ර කලාව

## ශාලාධිපති උපදෙස්

(පෙට්ටියක් / ගස්ලබු ගෙඩියක් / උස වීදුරුවක් / මැටි කලයක් / ඉරි සහිත රෙදි කැබැල්ලක් / මල් දෙකක් සහ කොළ පහක් සහිත අරලිය අත්තක් )



(ල.30)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 43 S III

නම: ..............................................

චිත්‍ර කලාව

කාලය පැය දෙකයි

**සැලකිය යුතුයි :**

- ★ ඔබ ඇඳිය යුත්තේ **එක** චිත්‍රයක් පමණි.
- ★ ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලිව ලියන්න.
- ★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතුය. තෙත් චිත්‍ර එකට ඇලී ඔබට අවාසිදායක විය හැකි ය.
- ★ දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිතා කළ හැකි ය.
- ★ ඇඳීමේ සුදු කඩදාසි හා ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

''අ'' කොටසින් හෝ ''ආ'' කොටසින් හෝ ''ඉ'' කොටසින් හෝ **එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.**

## ''අ'' කොටස - චිත්‍ර සංරචනය

01. වැස්සේ පාසල නිම වී නිවෙස් බලා යන සිසු සිසුවියෝ

02. කඨින පිංකම දා ගමේ පන්සල

03. ළිඳ ළඟ සොඳුරු කතාබහක යෙදී සිටින ගැමි ලියෝ

04. නගරයේ කලබලකාරී වීදියක්

## ''ආ'' කොටස මෝස්තර නිර්මාණ

01. සරල සත්ව හැඩ භාවිතයෙන් අඟල් 9 x 9 ප්‍රමාණයේ වීත්ත රෙද්දකට සුදුසු මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න ( මුද්‍රණය හා ව්‍යාප්තිය පිළිබඳ සැළකිලිමත් වෙන්න )

02. අඩි 8 x 6 ප්‍රමාණයේ ඇඳ ඇතිරිල්ලක් සඳහා මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න. ( කඩදාසියයට ගැලපෙන පරිදි පරිමානුකුලව සකසාගන්න )

03.සාම්ප්‍රදායික සැරසිලි භාවිතයෙන් වෘත්තාකාර පිත්තල බන්දේසියක් කැටයම් කිරීම සඳහා සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.

## ''ඉ'' කොටස මෝස්තර නිර්මාණ

01. අලුතෙන් හඳුන්වාදෙන මූල්‍ය ආයතනයක් සඳහා ලාංඡනයක් සැලසුම් කරන්න.

02. පාසලේ පැවැත්වෙන වාර්ෂික විවිධප්‍රසංගය සඳහා ආරාධනාපත්‍රයක් නිර්මාණය කරන්න.

03. වෙළඳපොළට අලුතෙන් හඳුන්වාදෙන දේශීය ආහාර වර්ගයක් සඳහා ලේබලයක් නිර්මාණය කරන්න.